# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 35 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ–තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුනි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

**1998 අංක 35 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ–තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 17 වැනි දින]

එල්.ඩී.—ඕ. 54/92.

**1980 අංක 16 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 'ඒ' - තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 'ඒ' – ප්‍රදේශයට මෙතෙක් කල් අයත්ව තිබුණු කොටසක් ජාත්‍යන්තර සිංහ සමාජයේ නව දිස්ත්‍රික්ක 306සී හි කොටසක් බවට පත්ව ඇති හෙයින් ද ; පූර්විකාව.

ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ–තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරයේ භාරකාර මණ්ඩලය විසින් එකී තරුණ භාරය, ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ හා 306සී එක්ව පරිපාලනය කළ යුතු බවට යෝජනාවක් සම්මත කර ගෙන ඇති බැවින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 35 දරන, ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ–තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 16 දරන ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ–තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය (සංස්ථාගත කිරීමේ) පනතේ 3 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(2) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරයේ භාරකාර මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) ශ්‍රී ලංකා ජාත්‍යන්තර සිංහ සමාජයේ 306ඒ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරයා සහ ජාත්‍යන්තර සිංහ සමාජයේ 306සී දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරයා ;

(ආ) ජාත්‍යන්තර සිංහ සමාජයේ 306ඒ දිස්ත්‍රික්කයේ පෙරාතුව ම සිටි දිස්ත්‍රික් පාලකවරයා සහ ජාත්‍යන්තර සිංහ සමාජයේ 306සී දිස්ත්‍රික්කයේ පෙරාතුව ම සිටි දිස්ත්‍රික් පාලකවරයා ;

(ඇ) ජාත්‍යන්තර සිංහ සමාජයේ 306ඒ දිස්ත්‍රික්කයේ කැබිනට් සභාවේ ලේකම්වරයා සහ ජාත්‍යන්තර සිංහ සමාජයේ 306සී දිස්ත්‍රික්කයේ කැබිනට් සභාවේ ලේකම්වරයා ;

(ඈ) ජාත්‍යන්තර සිංහ සමාජයේ 306ඒ දිස්ත්‍රික්කයේ කැබිනට් සභාවේ භාණ්ඩාගාරිකවරයා සහ ජාත්‍යන්තර සිංහ සමාජයේ 306සී දිස්ත්‍රික්කයේ කැබිනට් සභාවේ භාණ්ඩාගාරිකවරයා ;

(ඉ) ජාත්‍යන්තර සිංහ සමාජයේ 306ඒ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරයා විසින් පත් කළ යුතු එකී දිස්ත්‍රික්කයේ සිංහ සමාජයේ සාමාජිකයකු සහ ජාත්‍යන්තර සිංහ සමාජයේ 306සී දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරයා විසින් පත් කළ යුතු එකී දිස්ත්‍රික්කයේ සිංහ සමාජයේ සාමාජිකයකු ;

(ඊ) ජාත්‍යන්තර සිංහ සමාජයේ 306ඒ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කැබිනට් සභාවේ නිර්දේශය මත, එකී දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරයා විසින් පත් කළ යුතු, එකී දිස්ත්‍රික්කයේ සිංහ සමාජයේ සාමාජිකයකු සහ ජාත්‍යන්තර සිංහ සමාජයේ 306සී දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කැබිනට් සභාවේ නිර්දේශය මත එකී දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරයා විසින් පත් කළ යුතු එකී දිස්ත්‍රික්කයේ සිංහ සමාජයේ සාමාජිකයකු ;

(උ) ජාත්‍යන්තර සිංහ සමාජයේ 306ඒ දිස්ත්‍රික්කයේ සහ ජාත්‍යන්තර සිංහ සමාජයේ 306සී දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් පාලකවරුන් විසින් පත් කරනු ලැබිය යුතු ඒ එක් එක් දිස්ත්‍රික්කයේ හිටපු පාලකවරුන් දෙදෙනකු බැගින් ;

*ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සාමාන්‍ය සංශෝධන.*

**3.** ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ-තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය යන නාමයෙන් (ඒ නාමයෙන් හෝ "භාරකාර මණ්ඩලය" යන ලුහුඬු නාමයෙන්) ප්‍රධාන ප්‍රඥප්තියෙහි හෝ එය යටතේ සාදනු ලැබ

හෝ නිකුත් කරනු ලැබූ යම් රීතියක, දැන්වීමක හෝ වෙනත් ලේඛනයක, "ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ තරුණ අධ්‍යපාන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය" ගැන කර ඇති සෑම සඳහනකම පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ-තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය" යන යෙදුම වෙනුවට "ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306ඒ හා 306සී -තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය.

4. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙර "ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306ඒ -තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ති භාරය" විසින් හෝ එහි නමට සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ සෑම කොන්ත්‍රාත්තුවක් ම, ගිවිසුමක් ම හෝ වෙනත් කවර වූවද සාධන පත්‍රයක් නැතහොත් ලේඛනයක් ම මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසු "ජාත්‍යන්තර සිංහ සමාජ 306ඒ හා 306සී-තරුණ අධ්‍යාපන, පුනරුත්ථාපන සහ සේවා නියුක්ත භාරය" විසින් හෝ එහි නමට සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ එකක් ලෙස සළකනු ලැබිය යුතු ය".

කොන්ත්‍රාත් ආදිය සඳහා ඉතිරි කිරීම.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.